**ලුණුගල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**--------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 20 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූනි 13 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

1.3.1 **ශුද්ධ වත්කම්වල අඩුවීම**
--------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්වල අඩුවීම රු.9,404,387 ක් වීම.

1.3.2 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.3 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අන්‍යොන්‍ය වශයෙන් සමාන විය යුතු වුවද රු.4,471,635 කින් නොසැසඳුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලින් ලද රු.14,659 ක වරිපනම් බදු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් තැබීම නිසා වර්ෂයේ ඌණතාවය හා 2013 දෙසැම්බර් 31 දිනට කලින් ලද ආදායම් ගිණුමේ ශේෂය රු.14,659 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) කර්මාන්ත 04 කට අදාල නිමි වැඩ වටිනාකම රු.7,943,446 ක් වුවද, ගිවිසුම්ගත මුදල වන රු.7,979,000 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන සැලසීම හා රු.7,179,000 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.728,892 ක් අඩුවෙන්ද 2013 දෙසැම්බර් 31 දිනට ණයගැති ගිණුමේ ශේෂය රු.35,554 ක් වැඩියෙන් ද ණයහිමි ගිණුමේ ශේෂය රු.764,446 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.3,231,257 ක් වුවද, එය රු.3,610,520 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.379,263 ක් අඩුවෙන්ද 2013 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවස්ථා 06 කදී ණයහිමි ප්‍රතිපාදන සැලසිය යුතු රු.62,632 ක් සඳහා ප්‍රතිපාදන නොසැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය හා 2013 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.62,632 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පත්‍රයේ ශුද්ධ වත්කම්වල වටිනාකම සංචිත හා ණය ප්‍රාග්ධනයට සමානවිය යුතු වුවත් ශුද්ධ වත්කම්වල වටිනාකම රු.8,536,133 ක් වූ අතර, සමුච්චිත අරමුදල හා සංචිතවල වටිනාකම රු.9,008,793 ක් වූයෙන් රු.472,660 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) අන්තර් ගම්මාන නියමු ව්‍යාපෘතියේ ආයතන ශක්තිමත් කිරීම යටතේ මිලදී ගන්නා ලද රු.603,000 ක වටිනාකමින් යුක්ත මෝටර් රථ හා කරත්ත ප්‍රාග්ධනිත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය රු.603,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් අදාල උපයෝගී ලේඛණ සමඟ සැසඳීමේ දී පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලේඛණ අනුව ශේෂය | වෙනස | අදාල උපයෝගී ලේඛණය |
| --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | |
| සේවක ණය | 521,000 | 782,998 | 261,998 | සේවක ණය ලේඛණය |
| පොදු ගබඩා | 179,224 | 30,728 | 148,496 | ගබඩා උප ලේඛණය |

### 1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 23,716,411 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.23,635,684 ක් විය.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.4,659,358 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක් අදාල විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය

### 1.3.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන අවස්ථා 04 කදී රු.56,440 ක මුදලක් සහා අරමුදලින් වැයකර තිබුණි. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත | 2012 දෙසැම්බර් 31 දිනට අවස්ථා 215 කදී අයකරගන්නා ලද රු.40,074 ක නිමවුම් බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් තුල හිමිකම් නොපෑ වටිනාකම රු.91,161 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 හා 1980 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර බදු කුලී රජයේ තක්සේරුකරුවකු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මගින් වර්ෂ පහකට වරක් තක්සේරු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,924,972 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.586,344 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු.1,338,628 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,338,628 ක ශුද්ධ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,146,607 | 1,189,068 | (42,461) |
| බදු කුලී | 2,699,351 | 2,352,273 | 347,078 |
| බලපත්‍ර ගාස්තු | 799,637 | 547,520 | 252,117 |
| සේවා සඳහා ගාස්තු | 285,011 | 181,964 | 103,047 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,329,861 | 1,702,446 | 1,627,415 |
| වෙනත් ආදායම් | 157,823 | 92,227 | 65,596 |
| ආදායම් ආධාර | 10,286,857 | 8,957,456 | 1,329,401 |
| | | | |
| **පුනරාවර්තන වියදම** | | | |
| පෞද්ගලික පඩිනඩි | 12,913,382 | 11,594,333 | (1,319,049) |
| ගමන් වියදම් | 260,390 | 193,193 | (67,197) |

| | | | |
|---|---|---|---|
| සැපයුම් හා උපකරණ | 1,505,336 | 1,329,443 | (175,893) |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 280,472 | 252,514 | (27,958) |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 764,731 | 542,438 | (222,293) |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 346,960 | 319,092 | (27,868) |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 708,904 | 205,597 | (503,307) |
| | | | -------------- |
| පුනරාවර්තන ආදායමේ වැඩිවීම | | | 1,338,628 |
| | | | ========= |

2.3 **ආදායම් පරිපාලනය**
------------------------

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
------------------------------------

2013 ජනවාරි 01 දිනට පැවැති අක්කර බදු හිඟයෙන් කිසිදු මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයවී නොතිබූ අතර වරිපනම් බදු හිගයෙන් අයකිරීම සියයට 10 ක මට්ටමේ පැවතුනි. හිග ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා අසතුටුදායක බව නිරීක්ෂණය විය.

2.3.2 **වරිපනම් බදු**
-------------

වර්ෂ 05 කට වරක් වරිපනම් බදු සංශෝධනයක් සිදුකර ඒ අනුව වරිපනම් බදු අයකළ යුතු වුවද, 2013 වර්ෂය සඳහා ද 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකරමින් පැවැතුනි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
----------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.1,990,142 ක් අයවිය යුතුව තිබුණි. විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,751,155 |
| මුද්දර ගාස්තු | 238,987 |

2.3.4 ඉඩම් බදු
-------------
සභාව සතු බිබිල පාරෙහි පිහිටි පට්ටිපොල ගම්කාර්ය සභාව පවත්වාගෙන යන ලද බිම් ප්‍රමාණය අක්කර 02, රූඩ් 03 පර්චස් 34 ක් වන ඉඩම හා එහි පිහිටි ගොඩනැගිල්ල තුල ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යන අතර, ඒ වෙනුවෙන් සභාව විසින් කිසිදු ගාස්තුවක් අය කරගෙන නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය වත්කම්**
-----------------

සභාව සතු 78-9579 දරන අත්ට්‍රැක්ටර් රථය භාවිතයකින් තොරව වර්ෂ 3 කට අධික කාලයක් සභා භූමියේ නිෂ්කාර්යව දිරාපත්වෙමින් පැවැතුනි.

3.3 **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**
---------------------------------

සභා බල ප්‍රදේශය තුල එකතු කරනු ලබන කැලිකසල සභාව විසින් සභා භූමිය තුල අක්‍රමවත්ව බැහැර කරන අතර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර අක්‍රමවත්ව බැහැර කරන කැලි

කසල කුඹුක්කන් ඔයට එකතුවීමෙන් ස්වභාවික පරිසරයට හානිකර තත්ත්වයක් උද්ගතවන බව නිරීක්ෂණය විය.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

ප්‍රාදේශීය සභාවේ 2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම ප්‍රතිශතය | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| බලපත්‍ර ගාස්තු | 912,000 | 799,637 | 112,363 | 12.3 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,714,000 | 3,329,861 | 1,615,861 | 94.2 |
| වෙනත් ආදායම් | 244,000 | 157,823 | 86,177 | 35.3 |
| ආදායම් ආධාර | 11,968,201 | 10,286,857 | 1,681,344 | 14.0 |

-8-

| පුනරාවර්තන වියදම් | | | | |
|---|---|---|---|---|
| ගමන් වියදම් | 314,000 | 260,390 | 53,610 | 17.0 |
| සැපයුම් හා උපකරණ | 1,272,000 | 1,505,336 | 233,336 | 18.3 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 440,000 | 280,472 | 159,528 | 36.2 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 516,000 | 346,960 | 169,040 | 32.7 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 227,789 | 708,904 | 481,115 | 211.2 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගබඩා පාලනය